# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2479/47 - 2026 මාර්තු මස 10 වැනි අඟහරුවාදා - 2026.03.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ**
**යටිනුවර ප්‍රාදේශීය සභාවේ**
**සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන යටිනුවර ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ යටිනුවර ප්‍රාදේශීය සභාවේ අංක 01 කොබ්බෑකඩුව කොට්ඨාසයට තේරීපත් වූ හපුගොඩ රන්හවඩි ගෙදර වන්මික නිලන්ත අයත් වන්නා වූ සමගි ජන බලවේගය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම යටිනුවර ප්‍රාදේශීය සභාවේ අංක 01 කොබ්බෑකඩුව කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා අජිත් ප්‍රියන්ත මුතුගල නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

යටිනුවර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී හේවාගේ ධනුෂ්ක නලීන් සම්පත් ප්‍රනාන්දු වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් අජිත් ප්‍රියන්ත මුතුගල යටිනුවර ප්‍රාදේශීය සභාවේ අංක 01 කොබ්බෑකඩුව කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**එච්. ඩී. එන්. සම්පත් ප්‍රනාන්දු,**
තේරීම්භාර නිලධාරී,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

2026 මාර්තු මස 10 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මහනුවර.

EOG 03 - 0124

1A - PG 7568 — 08 (2026/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*